සයමස් බිළිඳෙකුට වධ හිංසා පැමිණවූ බවට පැවසෙන ප්‍රවෘත්තියක් පසුගිය දින මව්බිම සහ අරුණ පුවත්පත් තුළ (07/30) ආවරණය වී තිබූ අතර, එම පුවත් වාර්තාවන් දෙකම සමගින් සිදුවීමට අදාළ වින්දිත බිළිඳු දරුවාගේ ඡායාරූපයන් පළ කොට තිබුණු බව නිරීක්ෂණය කරන්නට හැකි විණි. මෙහිදී මව්බිම පුවත් වාර්තාව සමගින් පළව තිබූ ඡායාරූපය එම දරුවාගේ අනන්‍යතාවය සැඟවීමට කිසිදු උත්සාහයක් නොගෙන ඒ අයුරින්ම පළවී තිබූ අතර, අරුණ පුවත් වාර්තාව හා පළව තිබූ ඡායාරූපයේ එම දරුවාගේ ඇස් කළු කොටුවකින් වසා අනන්‍යතාවය සැඟවීමට ප්‍රයත්න දරා තිබිණි.

බාලවයස්කාර දරුවෙකුගේ හෝ දැරියකගේ අනන්‍යතාවය හෙළිදරවු කිරීමේදී ප්‍රවේසම් සහගත විය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම තුළ විශේෂයෙන්ම දැක්වෙන කරුණකි. ඒ අනුව බලන විට, මව්බිම පුවත් වාර්තාව එම බිළිඳු දරුවාගේ අනන්‍යතාවය සැඟවීමට උත්සාහයක් හෝ නොගැනීම ඔස්සේ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කොට නැතිද? අනෙක් අතට, අරුණ පුවත් වාර්තාව මෙහිදී වඩාත් ආචාර ධර්මානුකූල ප්‍රවේශයක් ගෙන නොමැතිද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Aruna**